# ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
# டிஜிட்டல் பொருளாதார அமைச்சு
# Ministry of Digital Economy

1101, 11 වන මහල, වන් ගෝල් ෆේස්, # 1ඒ, මැද පාර, කොළඹ 02
1101, 11 வது மாடி, வந் கோல் பேஸ், # 1A, சென்டர் வீதி, கொழும்பு 02
Unit 1101, 11th Floor, One Galle Face Tower, # 1A, Centre Road, Colombo 02

/modesrilanka
mode.gov.lk


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | දිනය<br>திகதி<br>Date |
| MODE/DEV/GENERAL/VOL IX | | 23.10.2026 |

**චක්‍රලේඛ අංකය:** MODE/2026/03

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
කොමිෂන් සභා ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියලුම සංස්ථා, ව්‍යාවස්ථාපිත ආයතන සහ රජය සතු සමාගම්වල ප්‍රධානීන්,

## PHP භාවිතයෙන් සංවර්ධනය කරන ලද වෙබ් අඩවි සහ වෙබ් යෙදුම්වල පවතින තීරණාත්මක ආරක්ෂක දුර්වලතා (Vulnerabilities) නිරාකරණය කිරීම

1. වෙබ් අඩවි සහ වෙබ් යෙදුම් සංවර්ධනය කිරීම සඳහා බහුලව භාවිත වන PHP මෘදුකාංගයට අදාළව හඳුනාගෙන ඇති ආරක්ෂක දුර්වලතා කෙරෙහි වහාම අවධානය යොමු කරන ලෙස ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සියලුම රජයේ ආයතන වෙත දැනුම් දෙනු ලැබේ.

2. ඒ අනුව CVE-2026-109618 සහ CVE-2026-109619 යන හැඳින්වීමේ කේත මගින් නම් කර ඇති ආරක්ෂක දුර්වලතා හේතුවෙන්, අනවසරයෙන් පද්ධති වෙත ප්‍රවේශ වීමේ, දත්ත සොරකම් කිරීමේ සහ ක්‍රියාකාරීත්වයට බාධා ඇති වීමේ දැඩි අවදානමක් පවතී.

3. එවැනි තත්ත්වයන් යටතේ, සිදුවිය හැකි අවදානම් අවම කර ගැනීම සඳහා පහත සඳහන් පියවර වහාම ගන්නා ලෙස රජයේ ආයතනවල අවධානය යොමු කෙරේ:

   i. PHP භාවිත කරන සියලුම පද්ධති සහ වෙබ් යෙදුම් හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක වන සංස්කරණ (Versions) තහවුරු කළ යුතු ය.
   ii. මෙම ආරක්ෂක දෝෂ සඳහා නිකුත් කර ඇති මෘදුකාංග පැච් (Software patches) භාවිතයෙන්, නිසි ක්‍රියාපටිපාටිවලට අනුව පද්ධති සහ වෙබ් යෙදුම් වහාම යාවත්කාලීන කළ යුතු ය. මේ සඳහා PHPහි නිල වෙබ් අඩවියේ (https://www.php.net) සපයා ඇති යාවත්කාලීන කිරීමේ උපදෙස් අනුගමනය කළ යුතුය.
   iii. අසාමාන්‍ය ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම සඳහා පද්ධති පිවිසුම් දත්ත (System logs) විශ්ලේෂණය කරන්න.
   iv. වහාම යාවත්කාලීන කළ නොහැකි අධි අවදානම් සහිත පද්ධතිවල අන්තර්ජාල ප්‍රවේශය සීමා කරන්න හෝ ඒවා විසන්ධි කරන්න.

4. මීට අමතරව මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක GovTech Sri Lanka ආයතනය විසින් දුර්වලතා අනාවරකයක් (Vulnerability detector) සංවර්ධනය කර ඇති අතර එය www.govtech.lk/cvesecure හරහා ක්‍රියාත්මක කර ඇත. අදාළ වෙබ් අඩවියක PHP දුර්වලතා තිබේ ද යන්න පරීක්ෂා කර බැලීමට සහ අවශ්‍ය තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා


දුරකථන / தொலைபேசி / Telephones: +94112334562
ෆැක්ස් / பெக்ஸ் / Fax: +94112334576
ඊ-තැපැල / மின் அஞ்சல் / E-mail: info@mode.gov.lk

CERT ආයතනය සමග සම්බන්ධ වීමට එකී අඩවි බාර තාක්ෂණ ශිල්පීන්ට අවස්ථාව ලබා දෙන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දිය යුතු ය.

5. මේ සම්බන්ධ වැඩිදුර විමසීම් සඳහා කරුණාකර 0112497900 / samithnp@govtech.lk ඔස්සේ GovTech Sri Lanka ආයතනය හෝ 0112691692 / info@ncsoc.gov.lk ඔස්සේ Sri Lanka CERT ආයතනය අමතන්න.

**වරුණ ශ්‍රී ධනපාල**
ලේකම්
ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය

**පිටපත්:**

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති
5. සභාපති/ප්‍රධාන විධායක නිලධාරී, GovTech Sri Lanka (Pvt) Ltd.
6. සභාපති/ප්‍රධාන විධායක නිලධාරී, Sri Lanka CERT